**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය - 2021**

**--------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 වියාචනය කළ මතය**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (**“**මණ්ඩලය”) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

**1.2 වියාචනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1. ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට රු.34,926,971 ක් වූ පරිගණක මෘදුකාංග ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 38 හි 72 වන වගන්තිය අනුව අස්පෘශ්‍ය වත්කමක් ලෙස ගිණුම්ගත නොකර දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. | අදාල දෝෂය සිදු වී ඇත. | ප්‍රමිත අංක 38 ප්‍රකාරව නිවැරදි ලෙස ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ)ලෙජරයට අනුව හමුදා ගමන් බලපත්‍ර ආදායම 2020 දෙසැම්බර් 31 දිනට රු.147,095,230 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු.142,858,305 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ගුවන් හමුදා ගමන් බලපත්‍ර ආදායම නිවැරදි ලෙස ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) මණ්ඩලය සතුව ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළදී ඉඩම් හා ගොඩනැගිලි ගිණුම තුළ අයිතමය කුමක්ද යන්න නිශ්චිතව හඳුනා නොගත් රු.48,168,750 ක අයිතම 04 ක් ඇතුළත් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත් කර ඇති ශ්‍රී ලං.ග.ම. සතු ඉඩම් හා ගොඩනැඟිලි වල වටිනාකම් වෙන් වෙන්ව හඳුනා ගැනීමට තරම් ප්‍රමාණවත් වාර්තා මණ්ඩලය සතු නොවීම හේතුවෙන් රු.48,168,750 ක වටිනාකම වෙන් වෙන්ව හඳුනාගැනීමට ඇති නොහැකියාව මත එලෙස ඇතුළත් කර ඇත. | ඉඩම් හා ගොඩනැගිලි නිවැරදි ලෙස වෙන් වෙන්ව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 අනුව, මණ්ඩලය සතු රු.391,317,296 ක ඉඩම් හා ගොඩනැගිලි ශේෂය වෙන් වෙන්ව, ඉඩම් හා ගොඩනැගිලි ලෙස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර, ගොඩනැගිලි ක්ෂය කිරීම්වලට අදාල වත්කම් පිළිබඳ විස්තර ද විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඉඩම් හා ගොඩැනැගිලි ශේෂයෙහි හා ගොඩනැගිලි ක්ෂය වටිනාකමෙහි නිරවද්‍යතාවය හා වත්කම්වල පැවැත්ම සම්බන්ධයෙන් විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. | මේ වන විට ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම තක්සේරු කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර එම කටයුතු අවසන් වූ පසු පැරණි ශේෂයන්ද නිවැරදි අයුරින් මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිත අංක 16 අනුව ගොඩනැගිලි වටිනාකමට අදාලව ක්ෂය කිරීම් නිවැරදි ලෙස දැක්විය යුතු වේ. |
| (ඉ) මණ්ඩලයට අයත් පිරිවැය හඳුනා නොගත් ඉඩමක් රු.5,054,000,000 ක තක්සේරු වටිනාකමකට රාජ්‍ය ආයතනයක් වෙත පවරා තිබුණද, ඊට අදාල පිරිවැය ඉඩම් හා ගොඩනැගිලි වටිනාකමින් ඉවත්කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානය වනවිට භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු.4,954,000,000 ක් හා 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු රු.100,000,000 ක මුදල සංචිත ලෙස ගිණුම්ගත කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ඉඩමේ පැවරීමේ ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඊ) සමාලෝචිත වර්ෂය තුළදී පරිගණක හා ටිකට් මැෂින් යන්ත්‍ර රු.6,470,984 ක් වැඩියෙන් ක්ෂය කර තිබූ අතර, එම නිසා වාර්ෂික අලාභය එම වටිනාකමින් වැඩි වී තිබුණි. | අදාල දෝෂය සිදු වී ඇත. | පරිගණක හා ටිකට් මැෂින් සඳහා ක්ෂයවීම් ගිණුම්කරණ ප්‍රමිත අංක 16 අනුව නිසි ලෙස ගණනය කර ගැලපිය යුතු වේ. |

| | | |
|---|---|---|
| (උ) සමාලෝචිත වර්ෂය තුළ වත්කම් මිලදී ගැනීම් හේතුවෙන් වූ මුදල් ගලායාම් ලෙස රු.36,167,950 ක් මුදල් ප්‍රවාහයේ දක්වා තිබූ අතර, ඒ තුළ ණයට ලබාගත් බස්රථ 02 ක වටිනාකම වූ රු.8,400,000 ක මුදල ඇතුළත්ව තිබුණි. ඒ අනුව ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යාම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ලංකා අශෝක් ලේලන්ඩ් ආයතනය මගින් බස්රථ 02 ක් මුදල් ගෙවා ශ්‍රී ලං.ග.ම. වෙත මිළදී ගැනීම සිදු කර ඇත. එබැවින් එම වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම් තුළ ඇතුළත් කිරීම නිවැරදි වේ. | ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව සත්‍ය මුදල් ගලා ඒම් හා ගලා යාම් නිවැරදි ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු වේ. |
| (ඌ) සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයෙහි වෙනත් ආදායම් යටතේ දක්වා තිබූ රු.4,192,994 ක් වූ තොග ගැලපීම් ගිණුමේ ශේෂය සහ රු.8,786,886 ක් වූ ඉන්ධන තොග අතිරික්ත හෝ ඌනතා ගිණුමේ ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ගැලපීම් කර නොතිබුණි. | අදාල දෝෂය සිදු වී ඇත. | අදාළ තොග හා ඉන්ධන තොග අතිරික්ත හා ඌනතා ගිණුමේ ශේෂය නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපිය යුතුවේ. |
| (එ) 2001 වර්ෂයේදී බස් රථ එංජින් මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණු රු.2,981,392,313 ක ප්‍රදාන වත්කම්වල ජීවකාලය අනුව වාර්ෂිකව ක්‍රමක්ෂය නොකර සමාලෝචිත වර්ෂයේදී සම්පූර්ණ ශේෂයම සමුච්චිත අලාභයට ගැලපීම නිසා සමුච්චිත අලාභය එම ප්‍රමාණයෙන් අඩුවී තිබූ අතර මණ්ඩලයේ සෘණ අගයකින් යුත් ශුද්ධ වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවී තිබුණි. | බස්රථ එන්ජින් මිළදී ගැනීමට අදාලව ලද ප්‍රතිදාන (Grant) වසර 05 ක් ඇතුළත ක්‍රමක්‍ෂය (Amortize) කළ යුතුවේ. මෙම ප්‍රතිදානය වසර 05 ක් තුළදී ක්‍රමක්‍ෂය කර නොතිබූ අතර එම ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීම සඳහා හෝ ක්‍රමක්‍ෂය කිරීම සඳහා අදාල වන ගිණුම්කරණ ප්‍රමිත අනුව අදාල ගැලපීම සිදු කර ඇත.<br>ඒ අනුව LKAS 20 සහ LKAS 08 අනුව ගැලපීම් සිදු කර ඇත. | අදාළ භාණ්ඩාගාර ප්‍රදාන මගින් ලබා ගත් වත්කම් සඳහා වාර්ෂිකව<br>වත්කම්වල ජීව කාලය අනුව ක්‍රමක්ෂය කළ යුතු වේ. |
| (ඒ) සමාලෝචිත වර්ෂයේ බැංකු ගාස්තු වියදම රු.6,701,571 ක් ලෙස අවසන් ගිණුම්වල දක්වා තිබුණද, ඒ තුළ රු.711,616 ක බැංකු අයිරා පොලී ද, රු.307,664 ක කොන්ත්‍රාත් වේතන වියදම් ද, රු.1,630,963 ක සේවක ණය අයවීම් ද, රු.11,273 ක සිංහල අවුරුදු උත්සව ණය | අදාළ දෝෂය සිදු වී ඇත.මෙවැනි දෝෂයක් සිදු වී ඇති නමුත් එමගින් ලාභාලාභ ගිණුමේ අවසන් ශුද්ධ ලාභයට හෝ අලාභයට බලපෑමක් සිදු වී නොමැත. | බැංකු ගාස්තු නිවැරදි ලෙස ගිණුම්ගත කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| වාරික අයවීම් ද ඇතුළත්වී තිබුණි. | | |
| (ඔ) 2022 මැයි මස 09 වන දින රට තුළ ඇති වූ නොසන්සුන්තාවය හේතුවෙන් මණ්ඩලය සතු පිරිවැය රු.7,300,000 ක්වූ වාහන 03 ක් සහ ඩිපෝ 12 කට අයත් පිරිවැය රු.76,749,438 ක් වූ බස් රථ 18 ක් සඳහා දැඩි ලෙස හානි වී තිබුණ ද, ඒ පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 ට අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ශේෂපත්‍ර දිනයෙන් පසුව සිදුවීම් ගිණුම් ප්‍රමිතය අනුව හෙළිදරව් කළයුතුය. |
| (ඕ) මණ්ඩලයේ තොග සමීක්ෂණ වාර්තා අනුව වාර්ෂික අමතර කොටස් භෞතික තොග ශේෂය 2021 දෙසැම්බර් 31 දිනට රු.1,514,815,227 ක් වූ අතර, ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව තොගය රු.1,637,684,553 ක් විය. ඒ අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ තොග වටිනාකම රු.122,869,326 කින් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අදාළ තොග සමීක්ෂණ වාර්තා අනුව ගැලපීම් කර ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වේ. |

### 1.5.2 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දින ශුද්ධ වත්කම් අගය රු.9,790,092,091 ක සෘණ ශේෂයක් වීම හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි එය අහිතකර ලෙස බලපෑ හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොමැත. | මණ්ඩලය අඛණ්ඩ පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා යෝග්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල(රු.) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ)ස්ථාවර තැන්පතු අගය | 111,556,382 | ශේෂ සනාථ කිරීම් | පිළිතුරු ලබාදී නොමැත. | ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. |
| (ආ) දේපල පිරියත හා උපකරණ | 82,138,137 | වත්කම් උපලේඛනය | මෙම අයිතමයන් 2017 වර්ෂයට පෙර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කරන ලද අයිතමයන් වේ. මේ වන විට නිවැරදිව වත්කම් හඳුනා ගනිමින් එක් එක් අයිතමය වශයෙන් වෙන් වෙන්ව වත්කම් ලේඛනයට ඇතුළත් කර ඇත. | නිරවද්‍යතාව තහවුරු කර අවශ්‍ය සාක්ෂි ලබා දීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) අක්‍රිය ගිණුම් හර ශේෂය | 1,290,782,781 | විස්තරාත්මක උපලේඛනය | මෙම රු.1,290,782,781 ක හර ශේෂය තුළ ශ්‍රී ලංගම වෙත ලැබිය යුතු මුදල් ඇතුළත් වන බැවින්, ඒ පිළිබඳ වැඩිදුරටත් කරුණු සොයා බලා අක්‍රිය ගිණුම් නිවැරදි කිරීමට පත් කරන ලද කමිටුව විසින් අදාළ වාර්තාව ලබා දීමට නියමිත අතර, ඉන් අනතුරුව නිවැරදි කිරීම් සිදු කිරීමට නියමිතය. | අදාළ ශේෂයන්ගේ නිවැරදිතාව තහවුරු කර ගැනීමෙන් අනතුරුව එම ශේෂ පිළිබඳව අදාළ ගැලපීම් සිදු කළ යුතු වේ. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට රු.20,666,494 ක් වූ ණයගැති ශේෂය තුළ වසර 10 ට වැඩි රු.1,745,604 ක් ද වසර 02 ත් 10 ත් අතර, රු.2,413,953 ක් ද ණය ශේෂ තුළ ඇතුළත්ව තිබුණද, ඊට අදාළව අඩමාණ ණය සඳහා වෙන් කිරීම් කර නොතිබුණි. එසේම ඉහත ශේෂයට අදාළව ශේෂ සනාථ කිරීම්ද විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් අදාළ ශේෂයන්ගේ නිවැරදිතාවය විගණනයේදී සත්‍යාපනය කිරීමට නොහැකි විය. | පිළිතුරු ලබාදී නොමැත. | ලැබිය යුතු ශේෂයන් සඳහා වෙන් කිරීම් කළ යුතු අතර, අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනයට ලබා දිය යුතුය. ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට රු.2,833,830,765 ක් වූ වෙළඳ ණයහිමි ශේෂය තුළ වර්ෂ 10 ඉක්මවූ ණයහිමි ශේෂය රු.576,577,491 ක් ද, වසර 05 ත් 10 ත් අතර ණයහිමි ශේෂය රු.432,275,302 ක්ද වසර 02 ත් 05 ත් අතර, ණයහිමි ශේෂය රු. 513,266,201 ක්ද පැවති අතර, අදාල ශේෂ සඳහා ශේෂ සනාථ කිරීම්ද විගණනයට ඉදිරිපත් නොවීය. තවද ණයහිමි ශේෂ 10 කට අදාළව රු.90,420,175 ක හර ශේෂයන් නිරීක්ෂණය විය. | මෙම ශේෂයන් පෙර වර්ෂවල සිට පැවත එන ශේෂයන් වේ. එකී ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ සඳහා විස්තර හා උපලේඛන ඉදිරිපත් කළ යුතු අතර, ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට දේශීය මිලට ගැනීම් අත්තිකාරම් ගිණුමෙහි රු.1,468,624,856 ක ශේෂයක් පැවති අතර, ඒ සඳහා උපලේඛන ලබා නොදීම හේතුවෙන් එහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි වූ අතර, ඉන් රු.1,467,253,615 ක ශේෂයක් වසර 02 ත් 10 ත් අතර කාලයක සිට පවතින බව අනාවරණය විය. | අදාළ දෝෂය සිදු වී ඇත. මින් ඉදිරියට නිසි පරිදි අදාළ ලේඛන ලබා දීමට හා ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | අදාළ අත්තිකාරම් ලබාදීම හා පියවීම පිළිබඳ දැඩි අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1980 අංක 47 දරන පාරිසරික පනත හා 2008 ජනවාරි 28 දිනැති 1533/16 අති විශේෂ ගැසට් පත්‍රය | වාහන සේවා කිරීම සම්බන්ධයෙන් සියළු ඩිපෝවන් විසින් බලපත්‍රයක් ලබා ගත යුතු වුවද මණ්ඩලයේ කිසිදු ඩිපෝවක් විසින් එම බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන සේවා කිරීම සම්බන්ධයෙන් සියලුම ඩිපෝවන් ආරම්භ කිරීමේදී පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතුයි. නමුත් දැනට ශ්‍රී ලං.ග.ම. ඩිපෝවන් ස්ථාපිත කිරීමේදී මෙම ක්‍රියා පිළිවෙත ගැන අවධානය යොමුකර නොමැති බව පිළිගනී. | පනත ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) පීඑෆ්ඩී 2/2015 හා 2015 මැයි 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් එහි නිලධාරීන් සඳහා ජංගම දුරකථන පහසුකම් වෙනුවෙන් රු.7,729,446 ක වියදම් දරා තිබුණ ද, නියැදි පරීක්ෂාවේදී සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය තුළදී මණ්ඩලය සතු සම්බන්ධතා 1078 ක් වුවද සම්බන්ධතා 831 ක තොරතුරු පමණක් ලේඛනගත වී තිබුණි. සම්බන්ධතා 59 ක් භාවිත කරන්නේ කවුරුන්ද | පිළිතුරු ලබාදී නොමැත. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | යන්න තහවුරු කර ගත නොහැකි වුවද එම සම්බන්ධතා වෙනුවෙන් ද ගෙවීම් සිදු කර තිබුණි. | | |

(ඇ)රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | | |
|---|---|---|---|
| I. මු.රෙ.387 | අයිරා පහසුකම් ලබා ගැනීම නොකල යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මණ්ඩලය විසින් රු.62,423,460 ක් වටිනා අයිරා පහසුකම් ලබා ගෙන තිබූ අතර, ඒ වෙනුවෙන් වර්ෂය තුළදී රු.382,052 ක අයිරා පොලියක්ද ගෙවා තිබුණි. | මෙම වටිනාකමින් බොහෝ විට පෙන්නුම් කරනුයේ මුදල් පොතට අනුව අයිරාව වන අතර බැංකු ප්‍රකාශණය අනුව අයිරා පහසුකම් ලබාගෙන ඇත්තේ ඉතා සීමිත ඩිපෝ ගණනක් පමණි. | අදාළ මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතු වේ. |
| II. මු.රෙ.395(ඇ) | ප්‍රාදේශික කාර්යාල 05 ක්, ප්‍රාදේශීය වැඩපලවල් 04 ක්, ඩිපෝවන් 03 ක් ඉන්ධන පිරවුම්හල් 02 ක් සහ ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් 19 කට අදාළව සමාලෝචිත වර්ෂයේ අවසන් මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද එම ගිණුම්වලට අදාළව ශේෂ සනාථන ලිපි සහ දෙසැම්බර් මස බැංකු ගිණුම් ප්‍රකාශන ද ඉදිරිපත් කර නොතිබුණි. | 395 (ඇ) ශ්‍රී ලං.ග.ම. විසින් 2020 වර්ෂයේ සිට බැංකු සැසඳුම් පිළියෙල කිරීම ගිණුම්කරණ පද්ධතිය මඟින් සිදු කරනු ලබයි. එබැවින් ශ්‍රී ලං.ග.ම. සියලු ඒකකයන්ට අදාලව පිළියෙල කරනු ලබන බැංකු සැසඳුම් සියල්ල ගිණුම්කරණ පද්ධතිය මඟින් පරීක්ෂා කිරීමේ හැකියාව පවතී. | අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශ සමඟ ශේෂ සනාථ ලිපිද ඉදිරිපත් කළ යුතු වේ. |
| III. මු.රෙ 395(ඇ) | මුදල් රෙගුලාසි ප්‍රකාරව මුදල් නොකළ චෙක්පත් ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතු වුවද 2021 දෙසැම්බර් මස සකසන ලද බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු.17,577,369 කට අදාළ චෙක්පත් පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කර නොතිබුණි. | ශ්‍රී ලං.ග.ම. විසින් 2020 වර්ෂයේ සිට බැංකු සැසඳුම් පිළියෙල කිරීම ගිණුම්කරණ පද්ධතිය මඟින් සිදු කරනු ලබයි. එකී පද්ධතිය තුළින් නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් සහ තැන්පත් කළ නමුත් නිශ්කාෂණය නොවූ චෙක්පත් යන කාණ්ඩයට අයත් ලැයිස්තුවක් එහිම | අදාළ වටිනාකම දැක්වෙන චෙක්පත් ලැයිස්තුව ඉදිරිපත් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | ඇතුළත් කර ඇත. | |
| IV. මු.රෙ.396 | වසර 06 කට වැඩි නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු.2,977,706 ක් වටිනා චෙක්පත් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වර්තමානය වනවිට එම වටිනාකම අඩුකර ගැනීමට කටයුතු කර ඇත. | අදාළ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක - පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| I. 5.1.2 වගන්තිය | අරමුණු හා ඉලක්ක පදනම් කර ගෙන ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වුවද, මණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 5.1.2 වගන්තිය<br>2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩල පනතට අනුව මණ්ඩලයට පැවරී ඇති කාර්යය පිලිබඳ සැලකිල්ලට ගෙන ක්‍රියාකාරී සැලසුම් සකස් කර ඇත. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වේ. |
| II. 5.2 වගන්තිය | ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී අය වැය ගත ආදායම් හා වියදම් ප්‍රකාශනය, අය වැය ගත ශේෂ පත්‍රය, අයවැය ගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා අයවැයගත ප්‍රාග්ධන වියදම් ඉදිරිපත් කළ යුතු වුවත් මණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැසුම සකස් කිරීමේදී බොහෝදුරට සලකනු ලබන්නේ ප්‍රාග්ධන ව්‍යාපෘති හා ඒ ආශ්‍රිත ව්‍යාපෘතීන් වන අතර ඒ අනුව එම ව්‍යාපෘතී වලට අදාළව ඇස්තමේන්තු ගත වටිනාකම් අදාල ව්‍යාපෘති තුල දක්වා ඇත. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වේ. |
| (ඉ) ආයතන සංග්‍රහය VIII වැනි පරිච්ඡේදයේ 3.1 වන වගන්තිය සහ 3.2 වගන්තිය | අතිකාල සඳහා මුදල් වැය කළ යුත්තේ අදාළ කටයුත්ත ඉටු කිරීමට අන් කිසිම මාර්ගයන් නැති අති විශේෂ අවස්ථාවලදී පමණක් සහ නිශ්චිත වශයෙන් නියම කරන ලද්දා වූ ද සාමාන්‍ය වැඩ කටයුතුවලින් ඒකාන්තයෙන් පරිබාහිර | ශ්‍රී ලං.ග.ම. මූලා බලතල පවරාදීම අනුව අතිකාල සම්බන්ධව අනුමැතිය ලබාදිය හැකි නිලධාරීන්ගේ අනුමැතිය මත අතිකාල සඳහා ගෙවීම් සිදු කර ඇත. | ආයතන සංග්‍රහයේ දැක්වෙන පරිදි අතිකාල සඳහා විශේෂ අවස්ථාවලදී පමණක් යෙදිය යුතු වේ. |

වූ ද, හදිසි වූ ද සාමාන්‍ය වේලාව තුළ කළ නොහැකි වූ ද වැඩ සඳහා පමණක් වුවද, මණ්ඩලයේ සේවකයින් සඳහා සීමාවකින් තොරව අතිකාල දීමනා ලබා දී තිබුණි. මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ වැටුප් ලබන නිලධාරීන් 708 ක් රාජකාරි ඉටුකරන බව නිරීක්ෂණය වූ අතර, සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලයේ නිලධාරීන් 177 දෙනෙකු සඳහා මාසික වැටුප ඉක්මවා රු.12,573,754 ක මුදලක් අතිකාල දීමනා ලෙස ගෙවා තිබුණි.

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන වත්කම් ගිණුමේ ශේෂය රු.මි.1,167.5 ක් බැංකු මුදල් ගිණුමේ ශේෂය රු.මි.961.4 ක් අතැති මුදල් ශේෂය රු.මි.158.1 ක් වූ අතර ප්‍රාදේශික 10ක බැංකු අයිරා ශේෂය රු.මි.62.4 ක්ව පැවතුණි. මේ අනුව මණ්ඩලයේ මූල්‍ය කළමනාකරණය අකාර්යක්ෂමව සිදුකරනු ලබන බව මෙමගින් නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොමැත. | බැංකු ගිණුම්වල ප්‍රමාණවත් මුදල් පැවතියදී අයිරා පත්වාගෙන යාම සිදු නොකළ යුතු වේ. |
| (ආ)වවුනියා ඩිපෝවේ ස්ථාවර තැන්පත් ආපසු ගෙන රු.25,000,000 ක මුදලක් ණය පදනමට ප්‍රධාන කාර්යාලයට ලබා දී තිබුණි. ප්‍රධාන කාර්යාලය සමාන වාරික 10 කින් එම ණය පියවිය යුතු වුවත්, 2022 පෙබරවාරි 17 දින දක්වා කිසිදු ගෙවීමක් සිදු කර නොතිබුණි. මෙම මුදල් ලබා දීම නිසා වවුනියා ඩිපෝවට ස්ථාවර තැන්පතු මගින් ලැබිය යුතුව | ශ්‍රී ලං.ග.ම. විසින් උපයන ආදායම් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කිරීම මූලික අරමුණ ලෙස සලකා කටයුතු නොකරන අතර ආයතනයේ එදිනෙදා අවශ්‍යතා සහ සේවක වැටුප් ගෙවීම, අත්තිකාරම් ගෙවීම ආදී මූලික කරුණු අරමුණු කරගෙන මූල්‍ය පරිපාලනය සිදු කරනු ලබයි. | ප්‍රධාන කාර්යාල මගින් නිවැරදි මූල්‍ය කළමනාකරණයන් අනුව කටයුතු කළයුතු වේ. |

තිබුණු රු.6,754,832 ක වාර්ෂික පොලී මුදල අහිමි වී තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,059,980,180 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.2,103,088,145 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.956,892,035 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රු.3,785,259,102 කින් ආදායම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව මණ්ඩලයේ ආදායම් තුළ ඇතුළත් ප්‍රවේශ පත්‍ර ආදායම් සියයට 19 කින් හා ගමන් බලපත්‍ර ආදායම සියයට 42 කින් අඩු වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් 1:1.05 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය 1:0.72 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලය 2018 මාර්තු 20 දින ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල ඉදි කිරීම සඳහා පුද්ගලික සමාගමක් සමග රු.61,014,316 ක වටිනාකමකට ගිවිසුමකට එළඹී තිබුණි. ගිවිසුම ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු 2018 ජුනි 20 දින නිම කළ යුතු වුවද, 2022 අගෝස්තු 16 දින වන විටද, ඉදි කිරීම් කටයුතු අවසන් කර නොතිබුණු අතර, 2021.12.31 දිනට කොන්ත්‍රාත්කරුට රු.26,765,705 ක් ගෙවා තිබුණි.එසේම ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනිව මිලෙන් අඩු ලංසුව නොසලකා වැඩි ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීම නිසා මණ්ඩලයට රු.2,102,126 ක මූල්‍යමය අලාභයක් සිදු වී තිබුණි. තවද කොන්ත්‍රාත්කරු | ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල ඉදිකිරීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව සිදු නොකිරීම සම්බන්ධයෙන් විමර්ෂණයක් සිදු කිරීම සඳහා මෙයට අදාළ ලිපිගොනුව ශ්‍රී ලං.ග.ම. විශේෂ විමර්ෂණ අංශය වෙත යොමුකර ඇති බව ටෙන්ඩර් අංශය මඟින් වාර්තා කර ඇත. | ඉදිකිරීම් සඳහා අදාල ගිවිසුම් නියමිත උපදේශ මාලාවන් අනුව සකස්කර ක්‍රියාත්මක කළයුතු වේ.ගිවිසුම් කොන්දේසි අනුව ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

| | | |
|---|---|---|
| ගිවිසුම් පරිදි ඉදි කිරීම නිම නොකිරීම නිසා මණ්ඩලයට ඉන්ධන පිරවුම්හල ක්‍රියාත්මක වීමෙන් ලබා ගත හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි. එසේම විගණන පරීක්ෂණ අවස්ථාවේදී රු.12,610,500 ක් වටිනා ඩීසල් හා පෙට්‍රල් පොම්ප 07 ක් එම භූමියේ කිසිඳු ආරක්ෂිත පියවරකින් තොරව ගොඩගසා තිබුණු අතර, තැන්පත් කර තිබූ ඉන්ධන ටැංකිවල පියන් කොන්ත්‍රාත්කරු විසින් ඉවත් කර ගෙන ගොස් තිබුණි. නමුත් මේ දක්වා මේ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් මණ්ඩලය විසින් ගෙන නොතිබුණි. | | |
| (ආ) මණ්ඩලය විසින් පළාත් 09 තුළ වායු විමෝචන මධ්‍යස්ථාන 09 ක් ඉදි කිරීම සඳහා අදාළ උපකරණ කට්ටල 2018 අප්‍රේල් 26 දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි වාහන වායුවිමෝචන භාරකාර අරමුදල වෙතින් භාරගෙන තිබුණු අතර, මෙම මධ්‍යස්ථාන ඉදි කිරීම ශක්‍යතා අධ්‍යයනයකින් තොරව සිදු කර තිබුණි. මෙම වායු විමෝචන මධ්‍යස්ථාන අතරින් කුරුණෑගල හා මැදවච්චිය යන මධ්‍යස්ථාන ඉදි කිරීම් නිමකර කර තිබුණ ද, නීතිමය ගැටලුවක් නිසා අදාල මධ්‍යස්ථාන වසා තිබීම හේතුවෙන් එම මධ්‍යස්ථානවල වටිනාකම රු.මි.18.75 ක් වූ යන්ත්‍ර සූත්‍ර නිෂ්කාර්යව පවතින බවත්, මෙම වත්කම භාවිතා කිරීමට අදාලව සිවිල් වැඩ ඉදිකිරීමට අදාල රු.මි.89.84 ක ඇස්තමේන්තුගත මුදලින් රු.මි.22.48 ක් වැය කර තිබුණු අතර 2022 මැයි 30 දින වන විටද එම ඉදිකිරීම් නිමකරන ලද මධ්‍යස්ථාන 03 ක්ද නිෂ්කාර්යව පැවතුණි. | ශ්‍රී ලං.ග.ම. වායු විමෝචන මධ්‍යස්ථාන 09 ක් ඉදිකිරීම පිළිබඳ සැලසුම් සකස් කොට තිබූ බව පිළිගනී. නමුත් දැනට කුරුණෑගල ,මැදවච්චිය, රත්මලාන යන වායු විමෝචන මධ්‍යස්ථාන ක්‍රියාකාරී තත්වයේ තිබී පසුගිය සමයේ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් ක්‍රියා විරහිත තත්වයට පත්ව ඇත. | ප්‍රාග්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ශක්‍යතා අධ්‍යයන සිදුකර ඒ අනුව ඵලදායී ව්‍යාපෘති ක්‍රියාත්මක කළයුතු වේ. |

| | | |
|---|---|---|
| (ඇ) මණ්ඩලයේ සුඛෝපභෝගී බස්රථ 125 ක් සඳහා කැමරා හා ජී.පී.එස් (GPS) පද්ධතිය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ රු.33,628,840 ක ගිවිසුමකට එළඹ තිබුණි. මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට පෙර මූලික ශක්‍යතා අධ්‍යනයක්, පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් හා ප්‍රතිඵල පුරෝකථනය කරන ආකාරය පිළිබඳ අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. මේ සඳහා අදාළ ප්‍රසම්පාදන ගිවිසුමෙහි 8 වන වගන්තිය අනුව අය කළ යුතුව ඇති ප්‍රමාද ගාස්තු වන රු.3,362,884 ක් සැපයුම්කරුවන්ගෙන් අය කර ගෙන නොතිබුණි. | අදාල ආයතනයට ගෙවීම් කිරීමේදී ප්‍රමාද ගාස්තු අය කරගැනීම සම්බන්ධව ගැටළුකාරී තත්ත්වයක් ඇති වූ බැවින් සියලු විස්තර ඇතුළත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්‍රිකාවක් ඉදිරිපත් කළ අතර, එම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අදාලව අලාභ අය කිරීමකින් තොරව අදාල සැපයුම්කරු වෙත මුදල් ගෙවන ලෙස තීරණය ලබා දී ඇත. එකී තීරණය අනුව ගෙවීම් සිදු කර ඇත. | කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම් කොන්දේසි කඩකර ඇති අවස්ථා වලදී ගෙවීම් නොකළ යුතු වේ. |
| (ඈ) මණ්ඩලය සතුව රු.226,417,397 ක් වටිනා ටිකට් මැෂින් 10,575 ක් පවතින අතර, ඉන් රු.107,070,821 ක් වටිනා මැෂින් 4,250 ක් එනම් සියයට 40 ක ප්‍රමාණයක් ක්‍රියා විරහිතව තිබුණි. නමුත් මණ්ඩලය මෙම මැෂින් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හැකි තත්වයකට පත් කර නොතිබුණි. මෙම මැෂින් අතුරින් මැෂින් 493ක් අළුත්වැඩියාවට යොමු කර තිබුණ ද අළුත්වැඩියා කටයුතු කඩිනමින් ඉටු කර නොතිබුණු අතර, රු.432,305 ක් වන මැෂින් 23 ක් අස්ථානගත වී තිබුණි. | සියයට 50 වඩා වැඩි මැෂින් ප්‍රමාණයක් අවු 05 කට වඩා පැරණි වී ඇති බැවින් නිතර නිතර ආපදා වලට ලක්වේ. 2019 වර්ෂයෙන් පසුව ටිකට් මැෂින් මිලදී නොගැනීම නිසා ටිකට් මැෂින් අවශ්‍යතාවය යාවත්කාලීන වී නොමැත. | අදාල ටිකට් මැෂින් මිලදී ගැනීමේදී ජීවකාලය තුළ සේවා කිරීම් හා නඩත්තු කිරීම් ගිවිසුම් පරිදි කරවාගත යුතු වේ. |
| (ඉ) Park & Ride ව්‍යාපෘතිය යටතේ ධාවනය සඳහා ඉලක්කගත බස්රථ ගණන කොළඹ දිස්ත්‍රික්කයේ බස්රථ 25 ක් ද, මහනුවර දිස්ත්‍රික්කයේ බස්රථ 06 ක් ද විය. මේ සම්බන්ධයෙන් ධාවනය හා ආදායම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් | මෙම ව්‍යාපෘතිය සඳහා පුද්ගලික අංශයේ බස්රථ 25 ක් යොදවා ගත් අතර ඒ වෙනුවෙන් GPS යන්ත්‍ර 25 ක් සවි කරන ලදී. එම බස්රථ 2021 වර්ෂයේ කොවිඩ් කාල සීමාව තුළ ධාවනයේ යෙදවීම කඩින් කඩ සිදුවීම නිසා එහි අදායම් තත්වය ඉතා පහළ මට්ටමක පැවතීමෙන් බස්රථ හිමියන්ට ලැබූ අදායම් කොටස ඉතා සුළු | අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී නිවැරදී ලෙස ගිවිසුම්ගතව කටයුතු කළයුතු අතර, ඒවායේ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය අධ්‍යයනය කර ක්‍රියාත්මක කළයුතුවේ. |

| | | |
|---|---|---|
| නොකෙරුණි. එහෙත් Park & Ride ව්‍යාපෘතිය සඳහා GPS යන්ත්‍ර 25 ක් බාහිර පාර්ශවයන් සතු බස්රථ සඳහා සවි කිරීම වෙනුවෙන් මණ්ඩලය විසින් රු.939,750 මුදල් වැය කර තිබුණි.නමුත් මෙම බස්රථ මේ වන විට ධාවනයෙන් ඉවත් කර තිබුණි. තවද බස්රථ වලට සවි කරන ලද, කැමරා ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මට්ටමක පැවතුණි. ඒ හේතුවෙන් ධාවනයට යෙදවූ බස්ථ හිමියන්ගේ බස්රථ ධාවනයෙන් ඉවත් කරගන්නා ලදී. එසේ ඉවත් කරගත් බස්රථ සඳහා සවිකර තිබූ GPS යන්ත්‍ර නැවත භාරදෙන ලෙස දුරකථන මඟින් හා ලිපි මඟින් දන්වා ඇත. එසේ භාර නොදෙන්නේ නම් නීත්‍යානුකූලව කටයුතු කරන බවද දන්වා ඇත. | |
| (ඊ) මණ්ඩලයට අයත් ප්‍රාදේශීය කාර්යාල, ඩිපෝ, රියදුරු පුහුණු පාසල් හා ප්‍රාදේශීය වැඩපොළ පවත්වාගෙන යනු ලබන අතර, ඒවා දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි ස්ථාපනය කර තිබුණි. එම ආයතන පිහිටි ඉඩම් සම්බන්ධයෙන් නීත්‍යානුකූල අයිතිය ඇති, බදු පදනම මත ලබාගෙන ඇති ඉඩම්, පැවරීමක් හෝ වෙනත් යම් ආකාරයකට ලබාගෙන ඇති මණ්ඩලය සතු සියලු ඉඩම් පිළිබඳව මණ්ඩලය විසින් යාවත්කාලීන කරන ලද ඉඩම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. මණ්ඩලය සතු සියලු ඉඩම් හඳුනා ගැනීම, අයිතිය නිරවුල් කර ගැනීම හා ඒවායේ වටිනාකම තක්සේරු කිරීම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදු කර නොතිබුණි. තවද මණ්ඩලය සතුව ඇති භාවිතයේ පවතින ඉඩම් අනාරක්ෂිතව වල්බිහිවී පැවතුණි. | මේ වන විට මණ්ඩලය සතු ඉඩම් හා ගොඩනැඟිලි තක්සේරු කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. ඒ අනුව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර අවසන් වාර්තා 14 ක් මේ වන විට ලබා දීමට කටයුතු කර ඇත. තවද ඒකක 157 කට අදාලව තක්සේරු කටයුතු සිදු කරන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත. මෙම ඉඩම් සම්බන්ධ අයිතීන් තහවුරු කර ගැනීම සංකීර්ණ කටයුත්තක් වන බැවින් මේ සඳහා යම් කාලයක් ගත වනු ඇත. | මණ්ඩලය සතු ඉඩම් සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගත යුතු අතර, එම ඉඩම් නිවැරදි ලෙස ගිණුම් වාර්තාවල වාර්තා කළ යුතු වේ. |
| (උ) 2022 ජූනි 16 දින වන විට මණ්ඩලයේ දෛනික බස් රථ අවශ්‍යතාවය 7,339 ක් වූ අතර, පවතින බස්රථ ඇණිය 6,951 කි. මෙයින් සියයට 32 ක් ධාවනය නොවන තත්වයේ පැවතුණි. ධාවනය වන බස් රථ 4,718 න් බස්රථ 2,742 ක් අවුරුදු 10 ට වඩා පැරණි බස් රථ විය. | අමතර කොටස් සහ ටයර් බැටරි සපයා ගැනීමට තිබූ බාධා නිසා බස්රථ ධාවනය අඩාල වී ඇති අතර දිගු කාලයක් තිස්සේ සේවක පුරප්පාඩු හේතුවෙන් යම් බස්රථ ප්‍රමාණයක්ද ධාවනයෙන් ඉවත්වී ඇත. සැලකිය යුතු කාලයක සිට බස්රථ ඇණිය සඳහා බස්රථ මිලදී නොගැනීම නිසා රථ ඇණිය යාවත්කාලීන වී නොමැත. | නිසි ලෙස කාල සටහන් අවශ්‍යතාවය සලකා බලා බස්රථ ඇණිය ධාවන තත්ත්වයෙන් පවත්වා ගැනීමට මණ්ඩලය කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඌ)මණ්ඩලයේ කාර්මික වැඩපල, රියදුරු පාසල් හා ඉන්ධනහල් දිගින් දිගටම වසර 03 ට වැඩි කාලයක් තිස්සේ අලාභ තත්වයේ පවත්වා ගෙන ගොස් තිබූ අතර ඒවා ලාභදායි තත්වයකට පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මණ්ඩලයේ රියදුරු පාසල්, කාර්මික වැඩපලවල් හා ඉන්ධනහල් ලාභදායිත්වයට ගෙන ඒම සඳහා අදාල කටයුතු කළ යුතු වේ. |

## 3.2 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තිය අනුව රාජ්‍ය ව්‍යාපාරවල සම්පත් රේඛීය අමාත්‍යාංශය වෙත ලබා දීම නොකළ යුතු වුවත්, මණ්ඩලයේ නිලධාරීන් 11 දෙනෙකු ප්‍රවාහන අමාත්‍යාංශයේ රාජකාරී ඉටුකර තිබුණු අතර, මණ්ඩලය ඔවුන් වෙනුවෙන් වැටුප් හා අතිකාල දීමනා ගෙවා තිබුණු අතර, ඒවා ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2021 ඔක්තෝම්බර් මස සිට ප්‍රවාහන අමාත්‍යාංශයේ රාජකාරි කටයුතු කරන නිලධාරීන් වෙනුවෙන් ශ්‍රී ලං.ග.ම. විසින් පුද්ගලයින් 07 දෙනෙකු වෙනුවෙන් ගෙවනු ලබන වැටුප් හා අතිකාල දීමනා ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ දින 127 ක් ප්‍රමාද වී 2022 ජූලි 04 දිනදී ය. | 2021 වර්ෂය තුළ රට තුළ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් කාර්ය මණ්ඩලය සේවය සඳහා වාර්තා කිරීම සීමා කිරීම හේතුවෙන් මෙම ප්‍රමාදය සිදු වී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වේ. |

**4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී ඉන්දියානු ණය පහසුකම් යටතේ බස් රථ 600 ක් රථ ඇණියට එකතු කිරීම සඳහා රු.මි.3,506 ක් ඇස්තමේන්තු කර තිබුණි. වසර 05ක් තුළදී මෙම බස්රථ 600 සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර තිබුණද බස් රථ මිලදී ගැනීම සිදුකර නොතිබුණි. | ඉන්දියානු ණය ආධාර ක්‍රමය යටතේ ආසන 32 බස්රථ 500 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය යටතේ බස්රථ 500 ක් සඳහා මුළු වියදම ලෙස රු.මි.5,741 ක වියදමක් දැරිය යුතු වුවද දැනට පවතින ආර්ථික තත්වය හමුවේ මූලික රු.මි.850 ක් යොදවා ප්‍රථමයෙන් බස්රථ 75 ක් ගැනීමට කටයුතු කර 2022 වර්ෂය අවසන් වීමට පෙර තවත් බස්රථ 200 ක් ගෙන්වා ගැනීමට මහා භාණ්ඩාගරය හරහා මුදල් වෙන් කරවා ගැනීමට කටයුතු යොදවා ඇත. | අදාල චක්‍රලේඛය අනුව ක්‍රියාකාරී සැළැස්මේ කටයුතු ඒ වර්ෂය තුළ ක්‍රියාත්මක කළ යුතු වේ. |